# 11 ශ්‍රේණිය - නර්තනය

# පාඩම : මණිපුරි නර්තන කලාව

# ( නිපු. අං. 6.2 )




ඉන්දියාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් හතරට අයත් යැයි සැලකෙන මණිපුරි නර්තනය **උත්තර භාරතයේ** ව්‍යාප්ත වී ඇති සුවිශේෂී නර්තන සම්ප්‍රදායකි. **උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතයට අනුව** සකස් වූ පද අන්තර්ගත වන අතර **ලාලිත්‍යානුකූල** චලන එහි අලංකාරය වැඩි කරයි. **අතිශය ලාසය** මණිපුරි නර්තනයේ ආරම්භය පිළිබඳ විමසීමේ දී එය **ආගමික පසුබිමක්** මත බිහි වූවක් බව පැහැදිලි වේ.

## ආරම්භය හා විකාශය

මණිපුරි බිහිවීම පිළිබඳ වූ උපත් කතා කීපයක්ම දක්නට ලැබේ. මණිපුරි වැසියන්ගේ ජීවිතය ආගම හා නැටුම සමඟ නිරන්තරයෙන්ම බැඳී පැවතුණි. **ක්‍රිෂ්ණ දෙවියන් මුල්කර ගනිමින්** ඔවුන් නර්තනය පැවැත්වූ අතර එම දෙවියන්ගේ කතා පුවත් බොහෝ ප්‍රමාණයක් මණිපුරි නර්තනයන් හි ද අන්තර්ගත වී ඇත.



මණිපුරි වැසියන්ගේ ජීවිතය , ආගම හා නැටුම සමඟ බැඳී පවතින්නේ ද , මණිපුරි නර්තනයේ මූලාරම්භය ආගමික පසුබිමක් මත ඇතිවූවක් නිසාවෙනි. මණිපුරි නර්තනයේ ආරම්භයට බලපෑ ආගමික පසුබිම පිළිබඳ විමසීමේ දී එය ,

**1.** උපත් කතා

**2.** නර්තනාංග

යනාදී ලෙස කොටස් කර විමසිය හැකිය. මණිපුරි නර්තනය බිහිවීම කෙරෙහි බලපෑ උපත් කතා කීපයක් ම දක්නට ලැබේ. ඒවා නම් ,

- **රාධා ක්‍රිෂ්ණා හා ශිව පාර්වතී යන දෙවියන් සම්බන්ධ උපත් කතා**
- **රාජා කාර්තා රජු සම්බන්ධ උපත් කතාව**

## ක්‍රිෂ්ණ දෙවියන් හා ශිව පාර්වතී සම්බන්ධ උපත් කතාව



ක්‍රිෂ්ණ විසින් නිර්මාණය කරන ලද සුන්දර නෘත්‍යක් , තම **ගෝපිකාවන් සමඟ එක්ව බ්‍රහ්මපුත්‍රා නදී තීරයේ** විහිදී පවතින මනරම් භූමි භාගයක රහසිගතව පැවැත්වීමට කටයුතු කළහ. මේ බව දැනගත් ශිව තමන්ට ද එම නෘත්‍යය නැරඹීමට අවස්ථාව ඉල්ලූ අතර ක්‍රිෂ්ණ දෙවියන් එය නරඹන්නට නොදී ය. පිටතින් සිට **අසා සිටීමට පමණක්** අවස්ථාව ලබා දුන්හ.

මේ හේතුව නිසා උරණ වූ ශිවගේ භාර්යාව වූ පාර්වතිය **අප්සරාවන්** සය දෙනෙකු කැඳවා , නෘත්‍ය උගන්වා ක්‍රිෂ්ණගේ ගෝපිකාවන් හා තරඟ කිරීමට සැලැස්වූහ. මෙය නැරඹීමට මණිපුරි භූමියට **බොහෝ වැසියන්** පැමිණි අතර **නා රජු තම නාග මාණික්‍ය** එහි තබා ආලෝකය ලබාදීමට කටයුතු කරන ලදී. රැස්ව සිටි පිරිසට එම ආලෝකය ප්‍රමාණවත් නොවූයෙන් නා රජු විසින් නා ලොව ඇති සියලු මාණික්‍ය ගෙනැවිත් තැන තැන විසුරුවා ආලෝකමත් කළේය. මේ නිසා මේ ප්‍රදේශය **මැණික්පුරය වී පසුව මණිපුරිය ලෙස** ප්‍රචලිත විය. තරඟයෙන් ක්‍රිෂ්ණගේ ගෝපීන් ජයග්‍රහණය කරන ලදී.

ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද එම නෘත්‍ය එම ප්‍රදේශයේ ම ස්ථාපිත වන්නට විය. පසුව එය මණිපුරි නර්තනය බවට පත්විය .

## රාජා කාර්තා රජු හා සම්බන්ධ කතා පුවත



රාජා කාර්තා රජු දැහැමින් රාජ්‍ය කරන කල්හි **නාග ගෝත්‍රිකයින්** පැමිණ රාජ්‍ය පැහැර ගන්නට විය. රජු ඇසෑමයට පලා ගිය අතර සිහිනෙන් **විෂ්ණු දෙවියන් දර්ශනය වී සඳුන් කොටයක් / වරකා කොටයක් පෙන්වා , එයින් ක්‍රිෂ්ණගේ රුවක්** පිළියෙල කර පූජා පවත්වන ලෙස පවසයි.

රුව නිර්මාණය කරන විට සැබෑ ලෙසම ක්‍රිෂ්ණ දෙවියන් දර්ශනය වී රජුව යුද්ධයට ධෛර්යමත් කළේය. රජු නැවත මණිපුරය බේරාගෙන , ක්‍රිෂ්ණගේ පිළිරුව එහි තැන්පත් කර පූජා පැවැත් වූහ. **නැටුම් , ගැයුම් හා රඟුම් වලින් එම උත්සවය රසාලිප්ත විය.** එය **රාස්ලීලා** නර්තනය ලෙස ප්‍රචලිත විය.

මෙම කතා පුවත්වලින් ද පැහැදිලි වන්නේ මණිපුරි නර්තනය බිහි වීමෙහි ලා මණිපුරි වැසියන්ගේ **ආගමික විශ්වාසය** බෙහෙවින් බලපා ඇති බවයි. දෙවියන් ඇදහීම මණිපුරි වැසියන්ගේ ජීවිතය හා සම්බන්ධ බවත් ඒ අනුව මණිපුරි නර්තනයට ද එය බලපා ඇති බවත් දැකගත හැකිය. මණිපුරි නර්තනය බිහිවීමෙහි ලා බලපා ඇති ආගමික පසුබිම පිළිබඳ විමසීමේ දී නර්තනාංග ද වැදගත් වේ.

## ලයහරෝබා




නෘත්‍ය **12** කින් සමන්විත මෙම නර්තනය **ඉන්ද්‍රධ්වජය** සංකේතවත් කරයි. මෙහි ඇතුළත් නෘත්‍ය දොළහේ දී දෙවියන් හා සම්බන්දධ වූ අංග ඇතුළත් වේ.

නිදසුන් :-

- **ලෛයිකෝබා** - ස්වකීය ආත්මය පිළිබඳ යාච්ඤාව
- **ආමන් අතෞ කෝඑයා** - දෙවියන් දැකීමෙන් ඇතිවන ප්‍රීතියෙන් නර්තනය
  කිරීම .

## රාස්ලීලා

ක්‍රිෂ්ණගේ චරිතය නැටුමෙන් හා ගීතයෙන් ඉරිපත් කරමින් නර්තනයේ යෙදේ.



- **මහාරාස්**
- **කුංජුරාස්**
- **වසන්තරාස්**
- **නෘත්‍යරාස්**
- **දිවාරාස්**

යනාදී ලෙස කොටස් පහකින් යුක්ත මෙම නර්තනය **පංච රාස්** ලෙසද හඳුන්වයි. මේවාහි **ක්‍රිෂ්ණගේ ලක්ෂණත් , රාධා හා ක්‍රිෂ්ණගේ ශෘංගාර ලීලාවනුත්** ඇතුළත් වේ. **උලුක්කල් / උදුක්බල් රාස් හා රාබේල් රාස්** මගින් ක්‍රිෂ්ණගේ බාල අවධිය හා සම්බන්ධ කතා පුවත් ඉදිරිපත් කරයි. රාධා ක්‍රිෂ්ණ මධ්‍ය කොටගෙන ගෝපිකාවන් ද නර්තනයේ යෙදේ.

## සෝෂ්ඨලීලා

ක්‍රිෂ්ණ හා ගෝපීන්ගේ කතා පුවත් රංගනයේ යෙදේ. තාණ්ඩව නෘත්‍යයකි.

## මණිපුරි නර්තනය ප්‍රචලිත ප්‍රදේශ



ඊසානදිග **භාරතයේ ඇසෑම් ප්‍රදේශයේ මනිපුරි ප්‍රාන්තයේ ඉම්පාල් නගරය** කේන්ද්‍ර කරගෙන මණිපුරි නර්තනය ප්‍රචලිත වී තිබේ.

## මණිපුරි හි සංගීතය





මණිපුරි නර්තනය සඳහා **උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදාය** භාවිතා කරයි. නමුත් මණිපුරියටම ආවේණික ලෙස එම සංගීතය හැඩ ගස්වාගෙන තිබේ. මණිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය **පුං / පුංග්** නමින් හඳුන්වයි . කෝල් බෙරය යනුවෙන් ද එය හඳුන්වනු ලැබේ. නමුත් එය වැරදි හඳුන්වා දීමක් බව විද්වතුන් ප්‍රත්‍යක්ෂ කර තිබේ .





මෙම බෙරය ස්වල්ප වශයෙන් ගැටබෙරයේ කඳේ ස්වභාවයට සමාන වන්නේ එහි කඳ මැදින් උස්ව පිහිටා දෙපසට තරමක් සිහින් වන ලෙස පිහිටා ඇති බැවිනි. නමුත් ගැට බෙරයේ මෙන් ගැටියක් නොමැත. මෙහි , බෙර ඇස් දෙකෙහි ම බදාම යොදා ඇති අතර එක් බෙර ඇසක විශ්කම්භය අඟල් 6 පමණ ද අනෙක් බෙර ඇසෙහි විශ්කම්භය අඟල් 4 ක් පමණද වේ. මෙහි වරපටි ඉතා ළඟින් යොදා ඇති අතර බෙරය වාදනයේ දී බෙර කඳ සුදු රෙද්දකින් ආවරණය කරනු ලැබේ.



මෙම බෙරය ඉනෙහි බැඳගෙන වාදනය කරනු ලබන අතර **පුංග්චෝලම් / පුංග්චෝලම්** නමින් බෙර කරේ එල්ලාගෙන කරන නර්තනයක් ද දැකගත හැකිය.

මීට අමතරව මණිපුරි සඳහා යොදාගනු ලබන අවශේෂ වාද්‍ය භාණ්ඩ වශයෙන් **බටනළාව , හක්ගෙඩිය , එස්රාජය , මංජීරා** යන වාද්‍ය භාණ්ඩ ද **තාල** නම් වූ ලෝහමය තාලම්පොටක් ද භාවිතා කෙරේ. කෝවිල්වල ස්තෝත්‍ර ගායනයේ දී **පෙනා** නම් වූ තත් වාද්‍ය භාණ්ඩයක් ද භාවිතා කරනු දැකගත හැකිය .

## මණිපුරි සරඹ අභ්‍යාස හා නර්තනාංග

මණිපුරි මූලික සරඹ අභ්‍යාස **චාලි / චලි** නමින් හඳුන්වයි . චාලි නර්තන කොටස් සංකීර්ණ වශයෙන් යොදාගෙන **පරෙංග්** නම් නර්තනාංගය සකසා තිබේ. මණිපුරි නර්තන සම්ප්‍රදායේ නර්තනාංග පහත පරිදි වේ .

- **රාස්ලීලා**
- **ලයහරෝබා**
- **පරෙංග්**
- **පුංග්චෝලම්/චෝලම්**
- **කර්තාල් චෝලම්**
- **සංකීර්තන්**

මනිපුරි නර්තනාංග පහත ආකාරයට ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය.

- **රාධා-ක්‍රිෂ්ණා හා සම්බන්ධ කතා පුවත් සහිත නර්තනාංග**
- **ශිව හා පාර්වතිය හා සම්බන්ධ කතා පුවත්** සහිත නර්තනාංග

## මණිපුරි නර්තන සම්ප්‍රදායේ වෙස් ගැන්වීම හා රංග වස්ත්‍රාභරණ

මූලික වශයෙන්ම මණිපුරි වෙස් ගැන්වීම රාධා-ක්‍රිෂ්ණා හා ගෝපිකාවන් වශයෙන් සිදු කෙරේ. මණිපුරි නර්තන සම්ප්‍රදායේ සුවිශේෂී බවට මූලික හේතුවක් වශයෙන් එහි රංගවස්ත්‍රාභරණ හඳුන්වා දිය හැකිය.

## රාධාගේ හා ගෝපිකාවන්ගේ රංගවස්ත්‍රාභරණ

රංග වස්ත්‍රාභරණ දෙස බැලීමේ දී රාධා **, ක්‍රිෂ්ණ හා ගෝපිකාවන්** සංකේතවත් වන පරිදි ඒවා නිර්මාණය වී ඇති බව පෙනේ. **ක්‍රිෂ්ණ චරිතයට පණ පොවන දරුවා දෙවියන් වෙනුවෙන් කැප කරයි. දෙවියන්ට මෙන් ගෞරව කරනු ලබයි.** එයින්ද පැහැදිලි වන්නේ මණිපුරි නර්තනයේ දක්නට ලැබෙන ආගමික පසුබිමයි.

- **කුමින්**
- **පොෂ්වාන්**
- **ක්වංගොයි**
- **රිෂම්පුරිට්**
- **මයිකුම් / මෛකුම්**
- **කොක්තුම්බි**
- **කුදොස්**
- **සෙනකුජි**
- **කුණ්ඩලානි**



## ක්‍රිෂ්ණගේ රංගවස්ත්‍රාභරණ




- ධෝතිය
- චූරා / මකුට පළඳනාව
- කාඩින්
- කුදොස්
- ගුංඟුරු

## මණිපුරි නර්තනය උගන්වනු ලබන අධ්‍යාපන ආයතනය හා ප්‍රවර්ධනය කළ ශිල්පීන්



**රබින්ද්‍රනාත් තාගෝර් තුමා** මණිපුරි නර්තනය සොයා ගන්නා තුරු එය , මණිපුරි ප්‍රාන්තය තුළ පමණක් හුදෙකලා වී තිබූ කලාවකි. එකල එය **ගුරුකුල ක්‍රමයක්** යටතේ පැවති බව සඳහන් වේ. මණිපුරි නර්තනය ලොවට හඳුන්වා දීමෙන් අනතුරුව එය උගන්වනු ලබන ප්‍රධාන අධ්‍යාපන ආයතනය බවට පත්වූයේ **ශාන්ති නිකේතනයයි.**



**( සැ.යු. මෙහි ඇති සියලුම පින්තූර අන්තර්ජාලයෙන් උපුටා ගත් පින්තූර බව කරුණාවෙන් සලකන්න )**


සැකසුම :

උදානි රන්දුනු

නර්තනය විෂය ගුරු උපදේශක

වෙන්නප්පුව අධ්‍යාපන කොට්ඨාසය

හලාවත අධ්‍යාපන කලාපය